# ලංකාවේ තරම් කිසිම රටක දේශපාලකයන් ඡන්දවලට මෙතරම් වියදම් කරන්නේ නෑ

## ඇමැති මිලින්ද මොරගොඩ



මිලින්ද මොරගොඩ මහතා ජන හමුව අමතමින්

සෑම මැතිවරණ කොට්ඨාසයකටම මන්ත්‍රීවරයකු පත්වන ආකාරයට ඡන්ද ක්‍රමය වෙනස් විය යුතු බව එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂක අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා ප්‍රකාශ කළේය.

ඔහු මේ බව ප්‍රකාශ කළේ වැල්ලවත්ත ධර්මාරාම මාවතේ පැවැති සංවාදශීලි ජනහමුවකට සහභාගිවෙමිනි.

මෙහිදී තවදුරටත් කතා කළ අමාත්‍ය මොරගොඩ මහතා පැවැසුවේ වත්මන් මැතිවරණ ක්‍රමයට අනුව දේශපාලනය කිරීමට අවශ්‍ය මුදල් හා බලය පමණක් බවය. මෙරට පැවැත්වෙන මැතිවරණයක් සඳහා අපේක්ෂකයකු වියදම් කරන මුදල් වෙනත් කිසිදු රටක දේශපාලනඥයකු වැය නොකරන්නේයැයි අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

මේ සියලු දෙයට හේතුව පවත්නා මනාප ඡන්ද ක්‍රමයෙ තිබෙන දෝෂය බව හෙතෙම වැඩිදුරටත් කීය.

පවතින මැතිවරණ ක්‍රමය හේතුවෙන් මන්ත්‍රීවරයකු නොමැති මැතිවරණ කොට්ඨාස රැසක් පවතින බවත්, මේ නිසා එම කොට්ඨාසවල ජනතාවට තමන්ගේ පොදු ප්‍රශ්න විසඳාගැනීමට තබා ඒවා ගැන සාකච්ඡා කිරීමට හෝ කෙනෙක් නොමැති බවත් අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

මෙම තත්ත්වය වෙනස් කිරීමට ඉදිරි මැතිවරණය අවස්ථාවක් කරගත යුතු යයි පෙන්වාදුන් අමාත්‍යවරයා ඉදිරි ඡන්දයේ දී පවතින ඡන්ද ක්‍රමය වෙනස් කිරීමට අවශ්‍ය පුළුල් බලය එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලබාදෙන මෙන් ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

පක්ෂ භේදයෙන් තොරව රට එක්සේසත් කළ ජනාධිපතිවරයා මේ රට ගොඩනැගීමේ ශක්තිය පවතී. යුද්ධය හමාර කොට මේ රටට නිදහස ලබාදුන් මහින්ද රාජපක්ෂ මහතාට සියලුදෙනා සහාය දැක්වුවහොත් ඉන් රටට දැයට යහපතක් සිදුවන බව හෙතෙම වැඩිදුරටත් පැවසීය.

ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් පසු රටේ සංවර්ධන යුද්ධය දියත්කර තිබෙන මේ මොහොතේ රජයට සියලු ජන කොටස්වල සහාය ලැබිය යුතුය. එසේම රටේ ක්‍රියාත්මක වන දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම යුගයේ අවශ්‍යතාවක් බවද අමාත්‍යවරයා පෙන්වා දුන්නේය. මේ සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගන්නට ජනාධිපතිවරයාට ඉඩ සැලසෙන්නේ ශක්තිමත් පාර්ලිමේන්තුවක් ලැබුණොත් පමණක් නිසා ඒ යුතුකම ජනතාව අතින් ඉදිරි මහ මැතිවරණයේ දී ඉටු විය යුතු යැයි අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා පෙන්වා දුන්නේය.මේ අවස්ථාවට දෙහිවල ගල්කිස්ස මහ නගර සභා විපක්ෂ නායක කේසර ලාල් ගුණසේකර මහතා ඇතුළු පිරිසක් සහභාගී වූහ.